ප්‍රථම මුද්‍රණය: ශ්‍රී බුද්ධ වර්ෂ ක්‍රි.ව. 2012 ඔක්තොම්බර් 15

# මේධා

## දික්වැල්ලේ මේධාලංකාර ගුණානුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය

සංස්කාරක : හතරබාගේ සුගතවංශ හිමි

ISBN-978-955-4615-00-7

පරිගණක වර්ණ යෝජනය : ශ්‍රියාන් සුරංග කුරේ

පිටකවරය : හතරබාගේ සුගතවංශ හිමි

ප්‍රකාශනය : සුබෝධාරාම පුරාණ මහා විහාරය
දෙහිවල

මුද්‍රණය : ක්‍රිස් ඇන්ඩ් ඩේව් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින්
නො. 47/28 බොරුපන මාවත,
රත්මලාන

මූල්‍යමය දායකත්වය : නිමල් ඩයස් ජයසිංහ

# කරගම්පිටිය විහාර චිත්‍ර.

මහාචාර්ය උදා හෙට්ටිගේ

මෙම ස්ථානයේ ඓතිහාසිකත්වය සහ ශේෂිත භෞතික උරුමය අනුව පැහැදිළිවම මහනුවර යුගය ඉක්මවා යන බව පෙනේ. එමනිසා ස්ථානීය වැදගත්කම අතිමහත්ය. මේ අතරින් මා වඩාත් අවධානය යොමු කරනුයේ මෙහි ඇති චිත්‍ර වෙතටයි. මේවා ඉතා ඉක්මනින් විනාශ වෙමින් පවතී. එහෙයින් මෙහි ඇති විශේෂත්වය සටහන් කරනු වස් මෙම ලිපිය ලිවීමට අදහස් කළෙමි. ''සුබෝධාරාමය'' යන ස්ථානීය නාමයට වඩා මා ඇලුම් කරන්නේ ''කරගම්පිටිය'' යන නාමයට බැවින් ''කරගම්පිටිය විහාර චිත්‍ර'' ලෙස මෙම ලිපිය මාතෘකා කොට දැක්වීමට මා අදහස් කරන ලදී.

කරගම්පිටිය රජමහා විහාරය ලෙස කා අතරත් ප්‍රසිද්ධ දෙහිවල නගරාසන්නව පිහිටි මෙම විහාරය ''සුබෝධාරාමය'' නමින් හඳුන්වනු ලබයි. කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ දෙහිවල මංසන්ධියට ඉතාම ආසන්නව පිහිටිය ද මෙහි ඇති ඓතිහාසික වැදගත්කම අතිශය විශාල වන්නේ එහි ඇති පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම නිසාමය. මෙය ඉතා සුන්දර ලෙස පිහිටි පොළොවෙන් මඳක් ඉහළට වන්නට ස්ථානගත වී ඇති අතර ගොඩනැගිලි සහ ස්ථානීයව දක්නට ලැබෙන සියලු ඉදිකිරීම් වල ද සුවිශේෂත්වය කියා නිම කළ නොහැකිය. ඒ එකකට එකක් විශේෂ වන ආකාරයට නිර්මාණය වී ඇති හෙයිනි. විහාරගෙය, ධර්ම ශාලාව, ආවාස ගොඩනැගිලි, සත්සතිගෙය ආදී සියල්ලෙහිම ඇත්තේ ඉතා සිත් ගන්නාසුලු ස්වභාවයකි. සිතුවම් අතින් ද දක්නට ලැබෙන්නේ කැපී පෙනෙන විශේෂත්වයකි.

විහාරයේ ඓතිහාසිකත්වය අනුව පරාක්‍රමබාහු රජ දවසේ සිට (ක්‍රි.ව.1412-1467) මහනුවර යුගය, බ්‍රිතාන්‍ය යුගය සහ ඊට පසු කාලීන අවධි දක්වාම වූ යුගයන් මෙම ස්ථානය සමඟ

සෘජු සම්බන්ධකම් පවත්වා ඇති බව පෙනේ. විශේෂයෙන් රාජාධිරාජසිංහ රජු කල (ක්‍රි.ව.1780-1800) හෝ ඊට ප්‍රථම මෙහි බුදු පිළිම ආදිය කරවන්නට ඇති බව ඒවායේ නිර්මාණ ලක්ෂණ අනුව පැහැදිලි වේ. (Chutiwongs, 1996). විශේෂයෙන්ම යටත් විජිත සමයේ මෙහි තිබූ සම්බන්ධතාවය විහාරගෙය අභිමුඛයෙහි දක්නට ලැබෙන වික්ටෝරියා මහ රැජිනගේ රුවෙන් සනාථ වේ. සත්‍ය ලෙසම මෙම සහසම්බන්ධතාවය එහි ඇති ශෛලීය ගුණාංග වලින් පවා අනාවරණය වේ. එසේම ලන්දේසි පිඟන් කැබලි මගින් විහාර පොළෝ මස්තකයෙහි වන මොසැක් මෝස්තර වලින් (ක්‍රි.ව.1898 ?) විහාරස්ථානයෙහි විවිධ ඓතිහාසික යුග වලදී දැක්වූ සම්බන්ධතාවය තවදුරටත් තහවුරු කරයි. මේ සම්බන්ධව සේනක බණ්ඩාරණායක මහතා ද අදහස් පළ කර ඇත. (Bandaranayake, 1986). මෙහි ඉතිහාසය පිරික්සා බැලීමේදී කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මෙන්ම රාජාධිරාජසිංහ රජුගේ අප්‍රමාණ දායකත්වය මෙම ස්ථානයට ලැබී තිබෙන බව චෛත්‍ය, සත්සතිගෙය, අනෙකුත් සාධක සහ ගොඩනැගිලිවල පුරාවිද්‍යාත්මක අගය පිරික්සීමෙන් සනාථ වේ. බෝධි වෘක්ෂය, සණ්ඨාරකුළුණ සහ විවිධ කාල පරාස නියෝජනය කරන කැටයම් සහ ලක්ෂණ වලින් ද මෙම ස්ථානය සමන්විතය.

**විහාරගෙයි චිත්‍ර.**

ඉතාම අලංකාර ලෙස ක්‍රමවත්ව නිර්මිත වැලි මළු කිපයක උසම මාලකයේ දක්ෂිණාර්ථව විහාරගෙය ස්ථානගත වී තිබේ. මෙය ඉතාම සිත් ගන්නා සුලු, සරල නිමාවකින් යුක්ත වේ. වාම් කුළුණු කීපයකින් යුත් විවෘත මණ්ඩපයකින් ඇතුළු වූ පසු විහාරගෙය අභිමුඛ බිත්තිය දක්නට ලැබේ. ඇතුළු මාලය සහ පිට මාලයකින් සමන්විත මෙය දොරටු කිහිපයකින් සමන්විත වේ. අභිමුඛයෙහි වන මකර තොරණ ඉතා සිත් ගන්නා සුලුය. ඇතුල් ගැබෙහි දක්නට ලැබෙන සැතපෙන පිළිම වහන්සේ සහ හිටි බුදු පිළිම වහන්සේ එහි ඇති ගාම්භීර සුන්දරත්වය ත්‍රිවු කරයි. චිත්‍ර බහුලව දක්නට ඇත්තේ ඇතුල් මාලයේ අභ්‍යන්තර හා පිට බිත්ති ආශ්‍රයෙහිත් සිවිලිමෙහිත් ය. පිටමාලයේ පිට බිත්ති වල ඉහල තිරුවෙහිත් සිවිලිමෙහිත් සිතුවම් ආවලියක් දක්නට ලැබේ.


සිතුවම් වල ශෛලිය හා නිර්මාණ ලක්ෂණ අනුවත් සෙසු ඉදිකිරීම් වල ලක්ෂණ සහ ඓතිහාසික සාධක සමඟත් ගලපා බැලීමේ දී විහාරගෙයි චිත්‍ර ශෛලීන් හා අවධි කිහිපයක් දක්නට ලැබෙන බව පැහැදිලිය. (හෙට්ටිගේ, 1986).

1. ඇතුල් ගැබ පිටත බිත්ති තුනෙහි ඇති චිත්‍ර
2. ඇතුල් ගැබ ඇතුල් බිත්ති තුනෙහි හා සිවිලිමෙහි ඇති චිත්‍ර
3. පිට මාලයේ සිවිලිම සහ බිත්ති චිත්‍ර

මෙම විශේෂ අවස්ථා ලෙස හුවා දැක්විය හැකිය.

## ඇතුල් ගැබ පිටත බිත්ති චිත්‍ර

මේ අතරින් පළමු වර්ගයට අයත් පරිශ්‍රයෙහි ඇති චිත්‍ර, චිත්‍ර කලාව අධ්‍යයනය කිරීමේ දී විශේෂ වැදගත්කමකින් යුක්ත වේ. මෙහි චිත්‍ර අවධිකරණය පිළිබඳව බණ්ඩාරනායක මහතාගේ අදහස වන්නේ මේවා ක්‍රි.ව. 1800, 1897 යන කාල වලට අයත් වන බවයි. (Bandaranayake, 1986). මේවායේ ජාතක කථා වලට ප්‍රධානත්වයක් දී තිබෙන අතරම කථා වස්තු හා සුවිසි විවරණ ද දක්නට ලැබේ.



**ඉසිපතනාරාමය - රේවතී විමාන වස්තුව (බටහිර බිත්තිය)**



මහා ජනක ජාතකයේ කොටසක් (උතුර බිත්තිය)



ඉසිපතනාරාමය - සැරියුත් මුගලන් රහතන් වහන්සේලා (බටහිර බිත්තිය)



රේවතී විමාන වස්තුව සවිස්තර ජායාරූපයක් (බටහිර බිත්තිය)



කට්ඨහාරි ජාතකයේ කොටසක් (බටහිර බිත්තිය)

සුවිශේෂත්වය.

මෙම සියලු චිත්‍ර ප්‍රධාන ලෙස කැපී පෙනෙනුයේ මෙම ස්ථානයෙහි ඇති සිතුවම් වලින් පැරණිතම චිත්‍ර මේවා වන බැවිනි. එසේම එකම වර්ණ රටාවක්, එකම රූප රටාවක් සහ එකම ශෛලීය ගුණාංගයන්ගෙන් යුක්ත වන බැවිනි. කාලානුරූපව ගත් කල මේ සියලු චිත්‍ර එකම කාලයකට අයත් වේ. මේවා බොහෝවිට 19 වන සියවස අග භාගයට නෑකම් දක්වතැයි උපකල්පනය කළ හැකිය. (ක්‍රි.ව.1895-1897 ?). මෙම චිත්‍ර වල දක්නට ලැබෙන්නේ උඩරටින් පහත රටට චිත්‍ර සංක්‍රමණය වීමේදී පැවති අන්තර් සම්ප්‍රදායක් ලෙසය. මෙය උඩරට සම්ප්‍රදායේ මුහුණුවර පමණක් ගෙන බිහිවන නවමු ආරක් ලෙස හැඳින්වීම සාධාරණය. රූපමය ස්වභාවයන්ගේ දක්නට ලැබෙන විචල්‍යතාවයන් මෙන්ම වර්ණ රටාවල දැක්වෙන වර්ණ ප්‍රභේද උත්පාදනය වීමේ ශෛලියත් රූප විෂයෙහි දක්නට ලැබෙන සවිස්තරාත්මක භාවයත් ඊට කදිම නිදසුන් සපයයි. (Gunasinghe, 1978). උඩරට හා පහතරට චිත්‍ර වල සම්මිශ්‍රිත වර්ණ රටාව එනම් පසුබිමට රතු මෙන්ම කලු වර්ණය භාවිතා කිරීම ආදියත් රූපවල දක්නට ලැබෙන ශෛලීගත හා ස්වභාවික අතර තත්වයන් ද දක්වාලිය හැකිය. (Bandaranayake, 1986). එමෙන්ම පර්යාවලෝකන රීතිය, එනම් අඳුර හා ආලෝකය මෙන්ම දුර හා ළඟ අතර ඇති පරස්පරතාවයන් යම් ලෙසකින් දක්නට ලැබීම මෙන්ම ස්වභාවිකත්වය තුළ අන්තර්ගත ත්‍රිමාණ ලක්ෂණයන්ගේ යම්බඳු ලක්ෂණ දක්නට ලැබීමත් මේ අතර කැපී පෙනේ. සෙසු කරුණු නම් දක්ෂිණ බද විහාරයන්හි නිර්මාණය වන මුල්කිරිගල, සමුද්‍රගිරි වැනි විහාරවල චිත්‍රකරණයට මේවායේ යම් බඳු සමානත්වයක් දක්නට ලැබීමයි. විශේෂයෙන්ම නිර්මිත වර්ණාවලියේ ආවේණික සහ අනන්‍යමය ස්වරූපයන් දක්වාලිය හැකිය. (Archer and Paranavitana, 1957). මහනුවර යුගයෙන් පසු පශ්චාත්කාලීන සාම්ප්‍රදායික රූපකරණයෙහි දක්නට ලැබෙන දිගැටි හැඩයෙන් යුත් ශරීරාංග දැක්වීමත් අධික සංකීර්ණත්වයෙන් හෙබි අලංකරණ සහ ඇඳුම් ආයිත්තම් ඇඳීමේ ක්‍රමවේදයත් සබරගමු හා දක්ෂිණබද සිතුවම් අනන්‍යතාවයන් සනාථ කරයි. (හෙට්ටිගේ, 1997). එහෙත් මහා නිමි ජාතකයේ චිත්‍ර හා මහා ජානක ජාතකයේ ඇතැම් රූප අතර ද යම්බඳු වෙනස්කම් දක්නට හැකිය. ඇස්, කන්, නාස, මුහුණු, බෙල්ල ආදියෙහි මෙම විශේෂත්වයන් කැපී පෙනේ. සමස්ථයක් ලෙස මෙම බිත්ති

ත්‍රිත්වයෙහි චිත්‍රවල වර්ණ ගැන්වීම් ආදිය සිදු වී තිබෙන බව සීරුවෙන් අධ්‍යයනය කරන කල්හි පෙනී යනු ඇත. සමහර තැනක දක්නට ලැබෙන නිල් වර්ණය මේ සඳහා නිදසුන් සපයයි. මෙහි උතුරු බිත්තියේ තණ්හා, රතී, රඟා නිරූපිත ස්ථානය දැක්විය හැකිය.



මහා ජනක ජාතකයේ කොටසක් (උතුර බිත්තිය)

මේ රූප විෂයෙහි පැහැදිලි වන තවත් විශේෂත්වයක් වන්නේ යුරෝපීය චිත්‍රකරණයේ බලපෑම් හා විශේෂ ලක්ෂණ මෙම ප්‍රධාන සිතුවම් ආවලියේ කැපී පෙනෙන බවයි. සිවිලිමෙහි දක්නට ලැබෙන දිව්‍යලෝක දර්ශන වල මෙම රූපමය ගුණාංග දක්නට ලැබුණ ද යම් යම් ප්‍රතිසංස්කරණ වලින් සමන්විත වන බව පෙනේ. (Chutiwongs, 1996). පසුකාලීනව අඳින ලද චිත්‍ර වල වර්ණ මේ ආශ්‍රයෙහි තැන තැන ගල්වා තිබෙන බවයි.

**ඇතුල් ගැබ ඇතුල් බිත්ති චිත්‍ර.**

මෙම චිත්‍ර ඇසුරෙහි දක්නට ලැබෙන චිත්‍ර ශෛලිය අනුව ඉහත චිත්‍ර වලට වඩා පශ්චාත් කාලීන ලක්ෂණ නිරූපණය කරන මෑත යුගයක් පිලිබිඹු කරයි. එහෙත් මෙහි ඉහතින් ඇති තීරු වල එන සූවිසි විවරණ අවස්ථා හා දකුණු පස බිත්තියේ චිත්‍ර පසුකාලීන වර්ණ ගැන්වීම් වලින් යුක්තය. සෙසු චිත්‍ර සමහර විටෙක ඇතුළු මාලයේ පිට බිත්ති වල චිත්‍රවල කාලයට අයත් විය හැකිය. එසේම ප්‍රධාන සැතපෙන පිළිම වහන්සේ වටා ඇති රැස් වලල්ල මෙම කාල පරාසය නියෝජනය කරතැයි සැක සහිතය.

ඇතුල්මාලයේ බුදු පිළිම වර්ණ ගැන්වීම් සහ රහතන් වහන්සේලාගේ රූප 1950 ගණන්වලට අයත් යැයි නිගමනය කළ හැකිය. (Chutiwongs, 1996). ඒවා ඉතාම පශ්චාත් කාලීන ස්වරූපයෙන් යුක්ත වනවා මෙන්ම එම කාල පරාසය නියෝජනය කරන වර්ණාවලියකට සමීප වන බැවිණි. නූතන ලක්ෂණ හා ගුණාංග මේ තුළ දක්නට ලැබේ. විහාරයේ පෞරාණිකත්වයට මෙම චිත්‍ර කොටස් අතිශය බාධා පමුණුවයි.



ශ්‍රාවක රූප

## පිටමාලයේ සිවිලිම හා බිත්ති චිත්‍ර.

දිව්‍ය ලෝක දර්ශන වලින් යුක්තයි. දෙවිවරු වැඩ සිටින ආකාරයත් විෂ්ණු, ශක්‍ර, බ්‍රහ්ම රූප ද වේ. මීට අමතරව මල් මෝස්තර දැකිය හැකිය.


බිත්ති වල උම්මග්ග ජාතකයේ දර්ශන ගණනාවකින් සමන්විත වී ඇත. වර්ණ රටාව, සංකලනය මෙන්ම වර්ණ පූරණය හා දර්ශන සංරචනය යන අංග වලින් නවීන ලක්ෂණ පෙනේ. විහාරය කිහිපවතාවක් ප්‍රතිසංස්කරණය වී ඇති බැවින් පසුකාලීනව මේවා ඇඳ තිබේ. නිල් පැහැය බහුලව යොදා ඇත. පිට මාලයේ පිට බිත්ති හා ප්‍රදක්ෂිණා පථයේ චිත්‍ර හා මකර තොරණ තදාශ්‍රිත චිත්‍ර එක් යුගයක ශෛලීය ලක්ෂණ අනුව 20 වන සියවස ආරම්භය (1920 ?) පමණ නියෝජනය කරතැයි සිතිය හැකිය.

තදකොළ, වර්ණ ප්‍රභේද, නිල්, දුඹුරු වර්ණ බහුලය. මේවායේ තාක්ෂණය දුර්වලය. වර්ණ මගින් උද්දීපනය කිරීමට උත්සාහ ගන්නා සවිස්තර භාවය පැහැදිලිව කැපී පෙනේ. වලාකුළු, වාස්තු විද්‍යාව, සංකීර්ණත්වය අතිශය ඉහළය. අහස, ගස්කොළන්, ගොඩනැගිලි, ගෘහ උපකරණ සියල්ල ස්වභාවි තත්වයට මුල්වී ඇත. ගොඩනැගිල්ලේ අලංකාර රූප විලාසය මේ සඳහා නිදසුන් වේ. මේ අනුව කාලය අනුවත් ශෛලිය අනුවත් ඓතිහාසිකත්වය අනුවත් මෙකී ස්ථානයේ යම් යම් සම්බන්ධතාවයන් පවතින බව පෙනේ.

කෙසේ වෙතත් මෙම ස්ථානයේ චිත්‍ර අතර පැරණිතම චිත්‍ර ලෙස සැලකිය හැකි ඇතුල්මාලයේ පිට බිත්ති චිත්‍ර ශ්‍රී ලාංකීය චිත්‍ර කලාව මහනුවර සිට පහතරටට සංක්‍රමණය වීමේදී වැදගත් වන ස්ථාන අතුරෙන් සුවිශේෂී එකකි. එසේම මහනුවර යුගයේ සිටම විහාරය නිර්මාණය වී විවිධ යුග දක්නට ලැබෙන චිත්‍ර ස්ථායක් ලෙසත් සැලකිය යුතු වැදගත්කමක් උසුලයි. චිත්‍ර වලට ආවේණික වූ ලක්ෂණ අනන්‍යතාවය තහවුරු කර ගනිමින් පහතරට චිත්‍ර හා උඩරට චිත්‍ර අධ්‍යයනය කරන්නන්ට මහගු අත්වැලක් සැපයෙන ස්ථානයක් සේ වැදගත්ය. ශ්‍රී ලාංකීය උරුමයේ කැපී පෙනෙන චිත්‍ර අතර ඉතාම වැදගත් වන මෙම ස්ථානය සඳහා දැනටමත් දේශීය හා විදේශිය සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය කර ගැනීමට සහ ආරක්ෂා කර ගතයුතු ස්ථානයක් ලෙසත් මෙහි ඇති



භූරි ප්‍රශ්නය (පිටක මාලය ඇතුල් බටහිර බිත්තිය)



යාම නාම් දෙව් ලොව (පිටක මාලය සිවිලිම චිත්‍ර)

ආශ්‍රිත ග්‍රන්ථ.


01. හෙට්ටිගේ,උදා(1986) අපාය සංකල්පය හා ශ්‍රී ලංකා විහාර චිත්‍ර (අමුද්‍රිත පර්යේෂණ නිබන්ධය) කැළණිය විශ්වවිද්‍යාලය. කැළණිය

02. හෙට්ටිගේ, උදා (1997) ***මහනුවර යුගයේ චිත්‍ර හා එහි ප්‍රධාන සාම්ප්‍රදායික ලක්ෂණ,*** දර්ශනපති උපාධි නිබන්ධනය, කැළණිය විශ්වවිද්‍යාලය.

03. හෙට්ටිගේ, උදා (2004) ***බෞද්ධ චාරිත්‍ර කලාවේ සංරචන විධි***, විමල ප්‍රභාස, සීදේවි ප්‍රින්ටර්ස්, දෙහිවල

04. හෙට්ටිගේ, උදා (2005) ***ශ්‍රී ලාංකීය විහාර චිත්‍ර කලාවේ අපාය සංකල්පය,*** කලා සඟරාව, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ

05. හෙට්ටිගේ, උදා (2009) ***හිඳගල චිත්‍ර,*** කොළඹ

06. හෙට්ටිගේ, උදා (2009) ***කලාව - ප්‍රථම භාගය***, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ

07. හෙට්ටිගේ, උදා (2009) ***පොළොන්නරුවේ චිත්‍ර සහ සම්ප්‍රදාය,*** පුලතිසි වංශය, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, කොළඹ

08. බස්නායක, එච්.ටී. සහ උදා හෙට්ටිගේ (2007) ***ජගත් කලා ප්‍රවේශය***, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ

09. Archer, W.G. and S. Paranavitana (1957) ***Ceylon, Paintings from Temple Shrine and Rock***, UNESCO, World art series no.8, Paris

10. Bandaranayake, Senaka (1986) ***The Rock and wall Paintings of Sri Lanka,*** Colombo

11. Chutiwongs, Nandana, Leelananda Prematilake and Roland Silva (1996) ***Paintings - Madawela Gangaramaya,*** Central Cultural Fund, Colombo

12. Gunasinghe, Siri (1978) ***An Album of Buddhist Paintings from Sri Lanka (Kandy Period),*** Colombo